# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2393/34 – 2024 ජූලි මස 18 වැනි බ්‍රහස්පතින්දා – 2024.07.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් අත්කර ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (අ) (1) වැනි වගන්තිය යටතේ නියමය

1983 සැප්තැම්බර් මස 05 වැනි දින අංක 261/3 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරිය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 1983 අංක 222 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත 1 වන උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 03J/83/UDA/224.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය: අත් 1/531 (කැබලි අංක 47)
2024 ජූලි මස 16 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහ ලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බිලූ මැන්ඩල් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බ්ලූමැන්ඩල් (කොට්ඨාස අංක 09 - බ්ලූමැන්ඩල්, කොළඹ මහ නගර සභා සීමාව තුළ) ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක 520408 හා 2024.06.06 දිනැති කැඩැස්තර සිතියමේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයෙන් යුක්ත වූ ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 2 – සුගතදාස ක්‍රීඩාංගනය – ප්‍රමාණය: හෙක්. 0.1897**

උතුරට: කේ. සිරිල් සී. පෙරේරා මාවත සහ කැබලි අංක 1; නැගෙනහිරට: කැබලි අංක 1 සහ ඕ. ඩී. රත්නායක හිමිකම් කියන කේ. සිරිල් සී. පෙරේරා මාවතේ වරිපනම් අංක 312/3 දරන ඉඩම ; දකුණට: ඕ. ඩී. රත්නායක හිමිකම් කියන කේ. සිරිල් සී. පෙරේරා මාවතේ වරිපනම් අංක 312/3 දරන ඉඩම සහ මාර්ගය; බටහිරට: මාර්ගය, කේ. සිරිල් සී. පෙරේරා මාවත සහ කැබලි අංක 1.

EOG 07 – 0159



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*